## 467 මංගලම් සුබ මංගලම්

මංගලම් සුබ මංගලම්
මංගලම් ජය මංගලම් //
අතින් අත ගත් තුරුණු යුවලට
වේ සුභාසිරි මංගලම්

ඔබ ඇතුලුවන පවුල් විමනේ මෙත් පහන් වැට දිලේවා
දෙපා නංවන හවුල් ගමනේ ආදරේ මල් පිපේවා
සොඳුරු ගිහිගෙයි සුහද සෙවනේ යුවතිපති දම් රැකේවා
ලොවැම සුරකින සුරිඳු සරණේ ඔබට නිබඳව ලැබේවා

එකට පියමං කරන හැමවිට මැණික් මාවත් මැවෙන්නේ
සමාදානය මතයි දියුණුවෙ රහස් දොරටුව ඇරෙන්නේ
සදා සෙනෙහැති එ රජ දහනේ ඔබයි අබිසෙස් ලබන්නේ
සමවැ දුක සැප බෙදා ගතිනොත් සමිඳු ආසිරි ලැබෙන්නේ